# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

# පෙරවදන

ශ්‍රී ලාංකික සන්දර්භය තුළ කොවිඩ්-19 වසංගතයේ දිගු කාලීන ප්‍රතිවිපාක සුවිශේෂයෙන් ගැටළු සහගතය. රජය කෙරෙහි ඇති මොනයම් හෝ මහජන ප්‍රසාදයක් වේ නම් එය පදනම් වී ඇත්තේ සාපේක්ෂව අඩු මරණ සහ ආසාදිත සංඛ්‍යාව මතය. එහෙත් සෞඛ්‍ය අර්බුදයෙන් ඔබ්බට, එනම් ආණ්ඩුකරණයට අදාළ තත්වය සළකා බැලීමට ජනතාව උනන්දු වී නැති බව පෙනේ. වඩාත්ම සැළකිල්ලට භාජනය විය යුත්තේ එයයි.

විධායක බලයේ අත්‍යන්ත වර්ධනයටත්, මිලිටරීකරණයටත් අවශ්‍ය ඉතා හොඳ හේතුවක් කොවිඩ්-19 වසංගතය මඟින් සපයා ඇත. මාස 3 ක් පමණ කාලයක් දක්වා පාර්ලිමේන්තුව නොකැඳවූ අතර, එම නිසා මහජන මූල්‍ය පරිපාලනය පිළිබඳ කිසිදු ව්‍යවස්ථාදායක අධීක්ෂණයක් නොවීය. වසංගතය ප්‍රධාන වශයෙන්ම කළමණාකරණය කෙරෙන්නේ හමුදාපති ශවේන්ද්‍ර සිල්වාගේ නායකත්වයෙන් ඒ සඳහාම පත්කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකායකින් වන අතර, විනයගරුක සමාජයක් ස්ථාපනය කිරීමටත් නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුමයන් පිළිබඳ සොයා බැලීමටත් පත්කරන ලද, සේවයේ නියුතු සහ විශ්‍රාමික හමුදා නිලධාරීන්ගේ සාමාජිකත්වයෙන් සැදුම්ලත් තවත් එවැනි කාර්ය සාධක බලකා බොහෝ ප්‍රමාණයක්ද ඊට සමාන්තරව පවතී. විශේෂයෙන්ම නැගෙනහිර පළාත පිළිබඳ සොයාබැලීමට පත්කළ කාර්ය සාධක බලකාය තුළ අදාළ පළාතෙහි බහු වාර්ගිකත්වය නියෝජනය නොවීම සැළකිය යුතු කරුණකි. සමාජ පර්යාය රෙගුලාසි ඔස්සේ පවත්වාගෙන යන අතර, තමන්ගේ වචනය රජයේ ප්‍රතිපත්තිය බවට පත්වන බව ජනාධිපතිවරයා පැහැදිලිව ප්‍රකාශ කර ඇත. එසේම කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත වැනි නීති සම්මත කරගැනීමට දැඩි කලබලයක් තිබූ නමුත්, දේශපාලන පක්ෂ හා සිවිල් සමාජ සංවිධාන විසින් එහි වලංගුභාවය ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක්කළ බවද සිහිපත් කළ යුතුය. අධිකරණයේ තීන්දුවට අනුව පනත සම්මත කිරීමට පෙර සංශෝධනය කරන්නට යෙදුණි.

දේශපාලන විධායකය කෙරෙහි තිබූ සංවරණ හා තුලන බොහොමයක් ඉවත් කළ 20 වැනි සංශෝධනය හරහා වේගවත් වූ විධායක අත්තනෝමතිකත්වය, මිලිටරීකරණයෙහි උදව්වෙන් තවදුරටත් වර්ධනය වී ඇත. ඉහත සඳහන් කළ කාර්ය සාධක බලකා වලට අමතරව දිස්ත්‍රික්ක 25

තුළම නිරෝධායන කටයුතු වල ප්‍රධාන සම්බන්ධීකාරකවරුන් ලෙස හමුදා නිලධාරීන් පත්කොට ඇත්තේ ඉතා විශාල බලතල ප්‍රමාණයක් සමගිනි. නිරෝධායන නීති උල්ලංඝණය කරන්නන් සිර භාරයට ගැනීම සඳහා ගුවන් හමුදා ඩ්‍රෝන සහ හමුදා කඩිනම් ප්‍රතිචාර ආරෝහක කණ්ඩායම් භාවිතයට ගැනේ. ඒත් සමගම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිවිල් සමාජ අවකාශය සංකෝචනය කිරීමත්, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට හිරිහැර සහ තර්ජනය කිරීමත් දිගින් දිගටම සිදුවේ. හදිසි නීතිය සම්බන්ධ පූර්ව අත්දැකීම් වලින් අප උගෙන ඇති පරිදි මෙහි සැබෑම අනතුර වන්නේ තත්වය කළමණාකරණය කරගැනීමට යැයි කියමින් හඳුන්වා දෙන භාවිතයන් සහ ක්‍රියාවලීන් සාමාන්‍ය ලෙස සැළකීමට සමාජය හුරු වීමේ ප්‍රවණතාවයයි.

මෙම කෘතිය තුළින් මේ කරුණු වලට අදාළ ප්‍රශ්න නඟනු ලැබේ. එහිදී ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, ආණ්ඩුකරණය, වසංගතයේ සුබසාධන බලපෑම, වාර්ගික සම්බන්ධතා, නිදහස් අධ්‍යාපනය, සංක්‍රමණික ශ්‍රමිකයින් සහ දේශපාලන අනුග්‍රාහකත්වය යන කරුණු සාකච්ඡා කෙරේ. මෙහි අන්තර්ගතය තුළින් අදාළ කරුණු අරබයා සංවාද හා විවාද සිදුවනු ඇති බව මගේ විශ්වාසය වන අතර, එම නිසා වඩා යහපත් ආණ්ඩුවක් සහ ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට මෙම කෘතිය දායක වනු ඇති බවද මම විශ්වාස කරමි.

**ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු**
විධායක අධ්‍යක්ෂ
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය